@ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2252/44 - 2021 නොවැම්බර් මස 05 වැනි සිකුරාදා - 2021.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 11/3/3/1/6B.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : LD/05/2007/MV/214B.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල පල්ලේසිය පත්තුවේ, E389A ගහහේන්වල වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2021.07.15 දින සම්මත කරන ලද, භූ ලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 13 හි අතිරේක අංක 156 හි, පත්‍ර අංක 323 දරන සැළැස්මේ, බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2.0196 ක් වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබලි අංක 11041**
ඉඩමේ නම: කොග්ගලවලපිටියේ හේන; විස්තරය: ලදු කැළෑව; හිමිකම් කියන අය: රජය; අනවසරකරු: පේරකනත්ත, ගහසිරිගම, පදිංචි කෝණාර මුදියන්සේලාගේ පහළ ගෙදර තෙන්නකෝන් බංඩා; ඉඩම් ප්‍රමාණය: හෙක්. 1.0764.

02. **කැබලි අංක 11042**
ඉඩමේ නම: කොග්ගලවලපිටියේ හේන; විස්තරය: ලදු කැළෑව; හිමිකම් කියන අය: රජය; භුක්තිකරු: පේරකනත්ත, ගහසිරිගම, පදිංචි කෝණාර මුදියන්සේලාගේ පහළ ගෙදර තෙන්නකෝන් බංඩා විසින් අංක එල්එල් 18 දරන බලපත්‍රය මත භුක්ති විඳ සිට ඇත; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.8094.

03. **කැබලි අංක 11045**
ඉඩමේ නම: කොග්ගලවලපිටියේ හේන; විස්තරය: ලදු කැළෑව; හිමිකම් කියන අය: රජය; අනවසරකරු: පේරකනත්ත, ගහසිරිගම, පදිංචි කෝණාර මුදියන්සේලාගේ පහළ ගෙදර තෙන්නකෝන් බංඩා; ඉඩම් ප්‍රමාණය: හෙක්. 0.1338.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021 නොවැම්බර් මස 30 වැනි දින පෙ.ව. 9.00ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2021 ඔක්තෝබර් මස 29 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-441

## ශුද්ධිපත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ඩීඑච්ඕ/එල්ඒඑන්/ඒසීකියුඊඑන්/ඒ3/2/8.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/15/2016/VE/266.

2021 ජූලි මස 01 වන දින අංක 2234/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් රජයට අත්පත් කර ගැනීම පිළිබඳ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමෙහි පරීක්ෂණ දිනයන් පහත පරිදි සංශෝධනය කරමි.

9 වන වගන්තිය හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව 2021.12.22 පෙ.ව. 10.00

වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය - 2021.12.08

යූ. පී. චන්දන අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-442

---

## ශුද්ධිපත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 6/3/7/15/13.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : LD/05/2007/MV/108-1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 2240/15 හා 2021.08.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ වූ ගහල පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාශයේ කඹරව ග්‍රාම නිලධාරි වසමේ, කඹරව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2020.06.29 දින සම්මත කරන ලද භූ ලක්ෂණාත්මක පිඹුර 20, අතුරු පිඹුරු අංකය 185, පත්‍රය 254 ලෙස සඳහන් වුවද එය ගහල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ කඹරව ග්‍රාම නිලධාරි වසමේ, කඹරව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2020.06.29 දින සම්මත කරන ලද භූ ලක්ෂණාත්මක පිඹුරු අංක 20, අතුරු පිඹුරු අංකය 185, පත්‍රය 254 හා අතිරේක අංකය 151, පත්‍රය 255 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

චින්තක ඉලංගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2021 ඔක්තෝබර් මස 27 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-443

---

## ශුද්ධිපත්‍රය

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : 6/3/7/15/13/10.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : LD/05/2007/MV/108H.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 2239/43 හා 2021.08.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ වූ ගහල පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාශයේ කඹරව ග්‍රාම නිලධාරි වසමේ, කඹරව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ පිඹුරු අංක TopoPP 20, අතිරේක පිඹුරු අංකය 188, පත්‍රය 262 ලෙස සඳහන් වුවද එය ගහල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ කඹරව ග්‍රාම නිලධාරි වසමේ, කඹරව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2020.11.26 දින සම්මත කරන ලද පිඹුරු අංක TopoPP 20, අතුරු පිඹුරු අංක 188, පත්‍රය 262 හා අතිරේක අංකය 156, පත්‍රය 263 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

චින්තක ඉලංගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2021 ඔක්තෝබර් මස 27 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-444

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.